00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2009

ළමා සාහිත්‍යය - ESC 2220

කාලය - පැය තුනයි.

දිනය - 2009.09.13 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. I. "ළමා සාහිත්‍ය සංකල්පය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 07)

II. ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍යයේ ඉතිහාසය සැකෙවින් දක්වන්න. (ලකුණු 18)

02. I. පෙර පාසල්වියේ දරුවන්ට උචිත කතන්දරයක ඇතුළත්විය යුතු මූලික ලක්ෂණ තුනක් (03) ලියන්න. (ලකුණු 06)

II. ඔබ ඉදිරිපත් කරන ලක්ෂණ තුන ඇතුළත් වන පරිදි උචිත කතන්දරයක් කෙටියෙන් ගොඩනගන්න. (ලකුණු 09)

III. කතන්දරය ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ හැකි ශිල්ප ක්‍රම තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. I. ළමා ගීතයක ඇතුළත් වියයුතු විශේෂ ලක්ෂණ මොනවාද ? (ලකුණු 05)

II. ඔබ හඳුන්වා දෙන විශේෂ ලක්ෂණ ඇතුළත් ළමා ගීත දෙකක් (02) ලියන්න. (ලකුණු 08)

III. සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ළමා ගීත යොදා ගත හැකි ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

04. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) ගැන විස්තර සටහන් ලියන්න.

I. ළමා පුවත්පත් හා සඟරා

II. රූපවාහිනී ළමා වැඩ සටහන්

III. සන්නිවේදනය හා රූකඩ

(ලකුණු 12 ½ x 2 = 25)

05. I. ශ්‍රී ලංකාවේ වර්තමාන ළමා සාහිත්‍යකරුවන්ට මුහුණ පෑමට සිදුවී තිබෙන ගැටළු තුනක් (03) සඳහන් කරන්න. එම ගැටළු කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

II. ඔබ ඉදිරිපත් කළ ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 15)

06. I. දරු නැලවිලි ගී යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

II. දරු නැලවිලි ගී ළමයාගේ මානසික වර්ධනයට බලපාන ආකාරය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

III. වර්තමාන ශ්‍රී ලාංකික මව්වරු දරු නැලවිලි ගී පිළිබඳ දක්වන ආකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 09)

- හිමිකම් ඇවිරිණි. -